WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි ] முழுப் பதிப்புரிமையுடையது ]All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

85 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2016 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2016 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2016

ගෘහ ආර්ථික විද්‍යාව I, II
மனைப் பொருளியல் I, II
Home Economics I, II

## ගෘහ ආර්ථික විද්‍යාව II

※ **පළමුවන** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

1. පහත සඳහන් සිද්ධිය අධ්‍යයනය කර, දී ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

මව, පියා, යොවුන්වියේ පසුවන දියණියකගෙන් හා පුතකුගෙන් සමන්විත වූ පවුලකි. ඔවුහු යහපත් පවුල් ජීවිතයක් ගත කරති. පියා රැකියාවක නිරතවන අතර මව ගෘහීය වැඩ කටයුතුවල නියැළෙන්නී ය. සකසුරුවම්කම මෙම පවුලේ අය තුළ දක්නට ඇත. ඔවුහු තම ආහාර පරිභෝජන රටාව පිළිබඳව විශේෂ අවධානයකින් කටයුතු කරති. දරුවන්ගේ හා සැමියාගේ අවශ්‍යතා තමා විසින් ම ඉටු කර දීමට මව උත්සුක වන්නී ය.

(i) තම පවුල සඳහා ආහාර සකස් කිරීමේ දී මව විසින් සැලකිල්ලට ගන්නා කරුණු **දෙකක්** සඳහන් කරන්න.
(ii) යොවුන් වියේ පසුවන පිරිමි දරුවාගේ විශේෂ පෝෂණ අවශ්‍යතා **දෙකක්** සඳහන් කරන්න.
(iii) රැකියාවට යන සැමියාට රැගෙන යාමට දිවා ආහාර වේල සකස් කිරීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු **දෙකක්** සඳහන් කරන්න.
(iv) මෙම දරුවන් අනුගමනය කරන හොඳ ආහාර පුරුදු **හතරක්** දක්වන්න.
(v) මෙම පවුල් පරිසරය යහපත් එකක් වීමට හේතුවිය හැකි කරුණු මොනවා ද?
(vi) ඔවුන්ගේ නිවසෙහි නිදන කාමරයක ජනේල තිරරෙදි සඳහා රෙදි තෝරා ගැනීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු **දෙකක්** සඳහන් කරන්න.
(vii) මොවුන්ගේ විසිත්ත කාමරයෙහි තබා ඇති රවුම් හැඩැති කුෂන් එක සඳහා යොදන කුෂන් කවරයට සුදුසු මෝස්තරයක් අඳින්න.
(viii) විකර්ණාකාර පටි භාවිත කර, මෙම කුෂන් කවරයෙහි අද්දර නිම කරන ක්‍රම **දෙකක්** සඳහන් කරන්න.
(ix) යොවුන් වියෙහි පසුවන දරුවන්ගේ කායික වර්ධනයේ දී පෙන්වන සුවිශේෂී ලක්ෂණ **දෙකක්** ලියන්න.
(x) යොවුන් දියණියගේ රැකවරණය සැලසීම සඳහා මව විසින් ගනු ලබන ක්‍රියාමාර්ග **දෙකක්** සඳහන් කරන්න.

WWW.OLEVELAPI.COM

2. පහත රූප සටහනෙන් දැක්වෙන්නේ මුල් ළමාවියෙහි දරුවකු සඳහා නිර්මාණය කරන ලද ගවුමකි.



(i) මෙම ළමා ගවුම විසිතුරු කිරීමට යොදා ගත හැකි ක්‍රම **තුනක්** දක්වන්න.
(ii) මෙහි සාය කොටස කඳට ඇල්ලීම සඳහා සකස් කිරීමේ දී අනුගමනය කරන පියවර ලියන්න.
(iii) මෙම රූපයෙහි ළමා ගවුම සඳහා ඉහළට පමණක් රැළි සහිත බෝරිච්චි අත් පන්නයක් යොදා ඇත. එම අත් පන්නය සඳහා පතරොම නිර්මාණය කිරීමේ දී අනුගමනය කරන පියවර රූප සටහන් ඇසුරින් පෙන්වන්න.

[හයවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**3.** (i) ශීතකරණය තුළ ආහාර ගබඩා කිරීමේ දී අනුගමනය කළ යුතු කරුණු **තුනක්** දක්වන්න.

(ii) පහත දක්වා ඇත්තේ ආහාර සහ පෝෂණයට අදාළ ප්‍රායෝගික ක්‍රියාකාරකම් කිහිපයක දී සිසුන්ට මුහුණපෑමට සිදුවූ ගැටලු තුනකි. ඒ එක් එක් ගැටලුව ඇතිවීමට හේතු විය හැකි කරුණු සඳහන් කරන්න.

(a) කට්ලට් බැදීමේ දී විසිරී යාම

(b) පලතුරු සලාදයෙහි කෙසෙල් කැබලි දුඹුරු පැහැ ගැන්වීම

(c) කිරිටොෆි ඝන නොවීම

(iii) දරුවකුට පාසලට ගෙනයාම සඳහා සැමන් සැන්ඩ්විච්ස් සහ අඹ බීම සකස් කර දෙන ලදී.

(a) සැමන් සැන්ඩ්විච්ස්වලට අදාළව දී ඇති වගුවෙහි කරුණු ගොනුකර දක්වන්න.

| ආහාරයේ අන්තර්ගත ආහාර ද්‍රව්‍ය | මහා පෝෂකය | සංයුතියෙහි, අඩංගු මූලද්‍රව්‍ය | ජීරණයෙහි අවසාන ඵල |
|---|---|---|---|
| ● පාන් | | | ග්ලූකෝස් |
| ● සැමන් | | C, H, O, N | |
| ● බටර් | මේදය | | |

(b) ඉහත ආහාර වේලෙහි අඹ බීම අඩංගු කිරීමේ වැදගත්කම ලියන්න.

**4.** (i) සත්ත්ව හා ශාක මේද අතර ඇති වෙනස්කම් දක්වන්න.

(ii) මේදවලින් සිරුරට ඉටු වන කෘත්‍ය **තුනක්** සඳහන් කරන්න.

(iii) විනාකිරි භාවිත කර පරිරක්ෂණය කරනු ලබන ආහාර වර්ග **දෙකක්** නම් කරන්න. ඉන් එකක් සැකසීමේ දී අනුගමනය කරනු ලබන පියවර ගැලීම් සටහනක් ඇසුරින් දක්වන්න.

**5.** (i) ගෘහීය සම්පත් කළමනාකරණය තුළින් සැලසෙන වාසි **තුනක්** සඳහන් කරන්න.

(ii) ගෘහීය අයවැය ලේඛනයක, ආදායම් මාර්ග, වියදම් ශීර්ෂ හා ඉතිරි කිරීම් ඇතුළත් කර ඇත. මේ එකිනෙකට උදාහරණ **දෙක** බැගින් ලියන්න.

(iii) නිල්, නිල් කොළ, කොළ යන බද්ධ වර්ණ භාවිතයෙන් කාමරයක් අලංකාර කර ගන්නා අයුරු පැහැදිලි කරන්න.

**6.** (i) ගර්භිණීභාවයෙහි ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න.

(ii) වයස මාස 6-12 ළදරුවන් පෙන්වන චාලක හැකියා **තුනක්** ලියන්න.

(iii) පහත සඳහන් දෑ පිළිබඳ ව සටහන් ලියන්න.

(a) ඩිම්බමෝචනය

(b) එන්ඩොමෙට්‍රියම (අන්තඃජදය)

**7.** (i) ලිංගික සම්ප්‍රේෂණ ආසාදන **තුනක්** නම් කරන්න.

(ii) යොවුන්වියෙහි දරුවන්ගේ මානසික වර්ධනය පිළිබිඹු කරන ලක්ෂණ **තුනක්** ලියන්න.

(iii) "යොවුන්වියෙහි දරුවකුගේ සංවර්ධනය කෙරෙහි සමවයස් කණ්ඩායම වැදගත් වේ." මෙම ප්‍රකාශය සනාථ කිරීම සඳහා කරුණු **හතරක්** ඉදිරිපත් කරන්න.

* * *

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....